**තේමාව** :- ජලය

**විෂයය** :- ගණිතය

**පන්තිය** :- 6 ශ්‍රේණිය

**පාඩම** :- 16 - ද්‍රව මිනුම්

**අරමුණු** :-

- ද්‍රව ප්‍රමාණ මැනීමට භාවිතා වන ඒකක හඳුනා ගැනීම.
- මිලිලීටර හා ලීටර අතර සම්බන්ධතා ගොඩ නැඟීම.

---

**නිපුණතාව** :- දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද්‍රව මිනුම් පිළිබඳව විචාරශීලීව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** :- දෛනික කටයුතුවලදී ද්‍රව ආශ්‍රිත මිනුම් යොදා ගනියි.

1. **පෙර ඉගෙනුම** :-
   - නිවසේ ඇති ද්‍රව මනින ද්‍රව්‍ය 10 ක නම් ලියා ඒවායේ සඳහන් ඒකකය ද ලියන්න.
   - ද්‍රව මනින ඒකක සඳහන් කර ඇති ඇසුරුම් හෝ ලේබල් එකතු කරන්න.
   - නිවසේ හෝ විවිධ අවස්ථාවලදී ජලය මැනීමට සිදුවන ප්‍රායෝගික අවස්ථා සටහන් කරන්න.

ක්‍රියාකාරකම :-

- ඔබ නිවසේ ඇති මේස හැන්දක් ගෙන එයින් පහත සඳහන් භාජන පිරවීමට කොපමණ වාර ගණනක් ජලය දැමිය යුතු දැයි පරීක්ෂා කරන්න.
  1. අඩු කෝප්පයක්
  2. ජෑම් බෝතලයක්
  3. ජෝගුවක්
  4. යෝගට් කෝප්පයක්
  5. වීදුරුවක්

2. **පන්ති කාමර ඉගෙනුම**:-
   - ක්‍රියාකාරකම 16.1 තනි තනිව සිදුකරයි.
   - එක් එක් අවස්ථාව අනුව ද්‍රව ප්‍රමාණ ප්‍රකාශ කිරීමට වඩාත් සුදුසු මිනුම් ඒකකය නිවැරදිව තෝරයි.
   - ක්‍රියාකාරකම 16.2 කණ්ඩායම් ලෙස සිදුකරයි.
   - ලීටර් හා මිලිලීටර් අතර සම්බන්ධතා ජලය භාවිතා කරමින් එක් එක් කණ්ඩායම් විසින් අනාවරණය කරයි.
   - කණ්ඩායම් ලෙස 16.1 අභ්‍යාසය සිදු කරයි.
   - ද්‍රව මනින ඒකක අතර සම්බන්ධතා ගොඩ නැඟීමට ජලයේ ඇති වැදගත්කම කෙටියෙන් ප්‍රකාශ කරයි.

3. **පසු ඉගෙනුම:-**
- 16.2 අභ්‍යාසය සිදු කරයි.
- නිවසේ ඇති ජලය මිනුම් කරන අවස්ථා ලියා දක්වයි.
- අවට පරිසරයේ ජලය ගබඩා වන ක්‍රම හා ඒවායේ මිනුම් ලබා ගන්නා ක්‍රම පිළිබඳව විමර්ශනය කර වාර්තාවක් සකස් කරයි.

4. **කේවල :-**
- ජලය වැවක ගබඩා කිරීමේදී එහි අඩංගු ද්‍රව ප්‍රමාණය මැන ගැනීමට භාවිතා කරන ක්‍රම පුවත්පත්/ ලිපි/ රූපවාහිනිය/ අන්තර්ජාලය යන ඕනෑම මාධ්‍යයක් භාවිතා කර තොරතුරු රැස් කර වාර්තාවක් සකස් කරන්න.
- එහිදී සැලකිලිමත් විය යුතු කරුණු මත වාර්තාව පරීක්ෂා කර ගුරුතුමියට /තුමාට ඉදිරිපත් කරයි.
- පදිංචි ප්‍රදේශයේ පවතින වැව්/ ජලාශ පිළිබඳව විමසන්න.

5. **පොදු:-**
- පන්තිය කණ්ඩායම් කල ආකාරයට එක් එක් අවස්ථාව අනුව ද්‍රව මැනීමට භාවිතා කරන ඒකක උදාහරණ ඇසුරින් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කිරීමට පුවරුවක් සකස් කරයි.
- ද්‍රව මනින ඒකක සඳහන් වන ඇසුරුම් හා ලේබල් සහිත පොත් පිංචක් සකස් කරයි.

6. **පාඩම ඉගෙනීමට අවශ්‍ය සහය :-**
- විවිධ ද්‍රව ඇසුරුම් සහිත ලේබල්
- මිනුම් ඒකක සඳහන් බෝතල්, භාජන, ඇසුරුම් උපකරණ, ටැංකි යනාදී උපකරණ
- විද්‍යාගාරයේ ඇති ද්‍රව මනින උපකරණ
- https://enenapiyasa.lk/ 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්
- https://www.e-thaksalawa.moe.gov.lk 6 ශ්‍රේණිය ගණිතයට අදාල සබැඳුම්
- https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=796#section-2
- https://www.deshaya.lk/article/43/features/12416
- http://www.vidusara.com/2020/02/05/feature3.html
- http://www.waterboard.lk/web/index.php?option=com_content&view=article&id=31&Itemid=189&lang=si